ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය : www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

**නිකුත් කළේ** : සන්නිවේදන දෙපාර්තමේන්තුව

**දිනය** : 02.10.2020

## ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රජය වෙනුවෙන්, කල් පිරෙන එ.ජ. ඩොලර් බිලියනයක් වටිනා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයක් පියවීම සාර්ථකව නිම කරයි

2020 ඔක්තෝබර් දෙවැනි දින, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් කල් පිරෙන එ. ජ. ඩොලර් බිලියනයක් වටිනා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයක්, නියමිත කූපන ගෙවීම් ද සහිතව, පියවීම සාර්ථකව නිම කරන ලදී.

මෙම පියවීම මගින් විදේශීය වගකීම් නිසි ලෙස පියවීම සඳහා රජයේ නොසැලෙන කැපවීම නැවත තහවුරු කෙරෙන අතර, එමගින් ආයෝජකයින්ගේ විශ්වාසය ඉහළ නැංවීමත් ණය සේවාකරණය පිළිබඳව ඇති නොකැළැල් වාර්තාව එලෙසම පවත්වා ගෙන යාමට මෙරට රජයට ඇති හැකියාව සහ කැමැත්ත සම්බන්ධයෙන් විදේශ ආයෝජකයින්ට පැවතිය හැකි ගැටලු දුරලීමත් සිදු කරයි. ශ්‍රී ලංකා ආර්ථිකයේ මෑත කාලීන ධනාත්මක වර්ධනයට සහ මෙම බැඳුම්කර පියවීමට මෙරට විදේශ විනිමය වෙළෙඳපොළ දැනටමත් ධනාත්මක ප්‍රතිචාර දක්වා ඇත. රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගනු ලැබූ පූර්ව ක්‍රියාමාර්ගවල සහාය ඇතිව මෙරට විදේශ විනිමය වෙළෙඳපොළ වෙත ලැබෙතැයි අපේක්ෂිත ගලා ඒම් සමඟ ඉදිරි කාලය තුළදී වෙළෙඳපොළ විශ්වසනීයත්වය තවදුරටත් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.